සියලුම හිමිකම් ඇවිරිණි
All Right Reserved

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023
## 2 தவணைப்பரீட்சை - 2nd Term Test

| ශ්‍රේණිය தரம் 11 Grade | කෘෂි හා ආහාර තාක්ෂණය - I<br>Agri & Food Technology<br>விவசாய மற்றும் உணவுத்தொழினுட்பவியல் | කාලය පැ. 1<br>ஒரு மணித்தியாலம்<br>One Hour |
|---|---|---|

♦ **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. අනුරාධපුර යුගයේ ඉදිකළ ප්‍රථම වැව වර්තමානයේ හඳුන්වනුයේ,
    1- තිසා වැව ලෙසය. 2- බසවක්කුලම වැව ලෙස ය.
    3- කලා වැව ලෙස ය. 4- නුවර වැව ලෙසය

02. පුරාණ වැව් පද්ධතියේ ස්වභාවික පෝෂක ප්‍රදේශ විද්‍යාත්මකව එකිනෙකට සම්බන්ධව පවතී. මෙය හඳුන්වනු ලබන්නේ,
    1- එල්ලංගා පද්ධතිය ලෙස ය. 2- වැව් ඉස්මත්ත ලෙස ය.
    3- පෝෂක ප්‍රදේශය ලෙස ය. 4- පෝෂිත ප්‍රදේශය ලෙස ය.

03. වැවක සොරොව්වෙන් පිටවන ජලයේ පීඩනය අඩු කිරිම සඳහා සකස් කර ඇති ව්‍යුහය,
    1- සලපනාව 2- බිසෝකොටුව 3- වාන් දොරටුව 4- වැව් බැම්ම

04. සෙවන සහිත ස්ථානවල බෝග නිෂ්පාදන පහත වැටීමට හේතු වන්නේ,
    1- උෂ්ණත්වය අඩුවීම ය. 2- උෂ්ණත්වය වැඩිවීම ය. 3- ආලෝකය අඩුවීම ය. 4- ආර්ද්‍රතාව වැඩිවීම ය.

05. එක්තරා ප්‍රදේශයක වාර්ෂික වර්ෂාපතනය 1500mm වේ. එම ප්‍රදේශය අයත් දේශගුණික කලාපය වන්නේ,
    1- වියළි කලාපය යි. 2- අතර මැදි කලාපය යි. 3- තෙත් කලාපය යි. 4- උඩරට තෙත් කලාපයයි.

06. පහත උපකරණ අතුරින් ප්‍රාථමික බිම් සැකසීමට යොදා ගන්නේ,
    1- තැටි නගුල හා දැති පෝරුවයි 2- දැති පෝරුව හා රොටවේටරයයි.
    3- තැටි නගුල හා ජපන් පරිවර්ත්‍ය නගුලයි. 4- රොටවේටරය හා ජපන් රොටරි වීඩරය යි.

07. පහත උපකරණ අතුරින් අතුරුයත්ගැම සඳහා භාවිත වනුයේ,
    1- තැටි නගුල හා දැති පෝරුව යි.
    2- තැටි නගුල හා රොටවේටරයයි.
    3- ජපන් රොටරි වීඩරය හා තුන් පුරුක් කල්ටිවේටරයයි.
    4- ජපන් රොටරි වීඩරය හා ජපන් පරිවර්ත්‍ය නගුල යි.

08. පහත සඳහන් බෝග අතුරින් ධාන්‍ය බෝග කාණ්ඩයට අයත් වනුයේ,
    1- බඩ ඉරිඟු, කුරක්කන්, තල ය. 2- බඩ ඉරිඟු, සෝගම්, මෙනේරි ය.
    3- තල, උඳු, කුරක්කන් ය. 4- මුං, බඩ ඉරිඟු, මෙනේරි ය.

09. අවසාදිත පාෂාණවලට අයත් වන්නේ,
    1- කිරිගරුඬය. 2- නයිස් ය. 3- හුණු ගල්ය. 4- ග්‍රැනයිට් ය.

10. බෝග වගාවට වඩාත් යෝග්‍ය පාංශු ව්‍යුහ ආකාරය කුමක් ද ?
    1- තනි කණිකා 2- ස්ථම්භික 3 - අණු කෝණාකාර 4- කැටිති

11. බෝග වගාව කෙරෙහි දේශගුණික සාධකවල බලපෑම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   - **මෙම ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,**

   A- අලබෝග වල අඛණ්ඩ වර්ධනය හා දිවා කාලයේ වැඩි උෂ්ණත්වයක් හා රාත්‍රී කාලයේ අඩු උෂ්ණත්වයක් තිබීම හිතකරය
   B- කැරට් හා බීට් වල පුෂ්ප පිපීම සිදුවන්නේ එම ශාක අඩු උෂ්ණත්වයක පැළ වූ විටය.
   C- දඹු කැබලි මුල් ඇද්ද වීමට සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩිවීම හිතකරය.

   1- A පමණි.   2- A හා B පමණි.   3- A හා C පමණි.   4- A, B හා C සියල්ලම

12. පසක් ජලයෙන් සංතෘප්ත අවස්ථාවේ සිට ක්ෂේත්‍ර ධාරිතාවට පත්විමේදී පසෙන් ඉවත් වන ජල ආකාරය වන්නේ,

   1- ජලාකර්ෂණ ජලය   2- කේශාකර්ෂණ ජලය   3- නිදහස් ජලය   4- ගුරුත්වාකර්ෂණ ජලය

13. සිසුන් පිරිසක් විසින් පාසල් වත්තේ වර්ෂාමානයක් ස්ථාපිත කරන ලද අතර ගුරුතුමා විසින් එහි දෝෂයක් පෙන්වා දෙන ලදි. එම දෝෂය විය හැක්කේ එම වර්ෂාමානය,
   1 - එළිමහන් ස්ථානයක පිහිටුවීමය.
   2 - ආසන්නව ගොඩනැගිල්ලේ උසට සමාන දුරකින් පිහිටුවා තිබීමය
   3 - බිම සිට සෙන්ටිමීටර 30 ක් උසින් පුනීල කට සිටින සේ පිහිටුවා තිබීමය.
   4 -තෘණ කපන ලද සමතලා බිමක පිහිටුවා තිබීමය.

14. නිර්මාංශ ආහාර අනුභව කරන්නෙකුට ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීම සඳහා ගතහැකි ආහාර කාණ්ඩයකි,
   1 - කැරට්, බෝංචි, බතල   2 - වට්ටක්කා, අර්තාපල්, බඩඉරිඟු
   3 - පරිප්පු, මුංඇට, සෝයා   4 - තල, පරිප්පු, බඩඉරිඟු

15. වර්ධනය බාල වී පත්‍ර කහ පැහැවී ති.බුණු නිවිති ශාකයක් ගලවා බැලූ විට එහි මූල පද්ධතියේ ගැට රාශියක් ඇති බව දක්නට ලැබුනි. මෙම තත්ත්වයට හේතුව විය හැක්කේ,
   1 - ශාකය වටපණු ආසානදයකට ලක් වී ඇති බවය.
   2 - මුල්වලට නයිට්‍රජන් තිරකරන බැක්ටීරියා ඇතුළු වීමය.
   3 - ශාකය පොස්පරස් ඌනතාවකට ලක් වී තිබීමය.
   4 - ශාකයට දිලීර ආසාදනයක් වී තිබීමය.

16. පැපොල් අස්වැන්න නෙළීමට වඩාත් සුදුසු අවස්ථාව වන්නේ,
   1 - ඵලය සම්පූර්ණයෙන්ම කොළපාට අවස්ථාවේ දී ය.
   2 - ඵලය 80% පමණ කහපාට වූ අවස්ථාවේදී ය.
   3 - ඵලය කොළ පැහැයේ සිට කහ පැහැයට හැරෙන අවස්ථාවේදී ය.
   4 - ඵලය සම්පූර්ණයෙන්ම කහ පැහැයට හැරෙන අවස්ථාවේදී ය.

17. ගෙවත්තේ සිටුවනු ලැබු කරවිල ශාකයක පත්‍රවල තැනින් තැන සිදුරු වන සේ හානිකර තිබූ අතර, කුඩා කෘමි විශේෂයක් පත්‍ර මත වසා සිටිනු දකින්නට ලැබුණි. මෙසේ ශාකය මත වසා සිටි කෘමි පලිබෝධකයා විය හැක්කේ,

   1 - ඉල් මැස්සාය.   2- එපිලැක්නාය   3- ගොයම් මැස්සාය   4- අවුලක පෝරාය.

18. ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තුලදී මුළුමනින්ම ඉවත් වන ක්‍ෂුද්‍ර පෝෂක වෙනුවට අලුතින් එම පෝෂක එක් කර නැවත පෙර තිබූ තත්ත්වයට පත් කිරිම හඳුන්වන්නේ,

   1- සරු කිරීම ලෙසය.   2- ප්‍රබල කිරීම ලෙසය   3- අවම කිරීම ලෙසය   4- පැසවීම ලෙසය

19. ඒකීය සූර්ය ප්‍රචාරකයක් මඟින් දඬු කැබලි මුල් අද්දවා ගැනීම පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- රෝපණ මාධ්‍යය ලෙස වැලි,කොම්පෝස්ට්, මතුපිට පස් 1:1:1 අනුපාතයට යොදා ගැනීම සුදුසුය.
B- දඬු කැබැල්ල සිටුවීමට ගන්නා බඳුනේ පතුලේ ජලවහන සිදුරු සෑදිය යුතුය.
C- ඒකීය සූර්ය ප්‍රචාරක සඳහා පොලිතීන් බඳුනේ උසින් 1/3 පමණ රෝපණ මාධ්‍ය රිරවිය යුතුය.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශ වන්නේ,

1- A හා B පමණි. 2- A හා C පමණි. 3- B හා C පමණි. 4- A, B හා C සියල්ලම

20. අතුරු බෝග වගාව ලෙස හැඳින්වෙන බෝග රටාවේදී,
1- ක්ෂේත්‍රයක බෝග වර්ග 2 ක් මාරුවෙන් මාරුවට වගා කරයි.
2- ක්ෂේත්‍රයක එක් බෝගයක් දීර්ඝ කාලීනව වගා කරයි.
3- ප්‍රධාන බෝගයක් අතරින් වෙනත් බෝගයක් හෝ බෝග වර්ග කිපයක් වගා කිරීම.
4- එක් බෝගයක් වගා කර එහි අස්වැන්න නෙලීමට ආසන්න වන විට තවත් බෝගයක් ස්ථාපනය කරයි.

21. පරිණත අවධියට පසුව අස්වැන්න නෙළීම නිසා අස්වැන්නේ තන්තුමය ස්වභාවය අඩු වීම සහ වැඩි වීම පෙන්නුම් කරන බෝග වර්ග පිළිවෙලින්,
1- ලීක්ස්, මුරුංගා 2- කැරට්, වැටකොළු 3- බණ්ඩක්කා, මෑ 4- තක්කාලි, බෝංචි

22.

| A | B | C |
|---|---|---|
| සුදු පැහැතිය<br>ගෝලාකාර කැට වේ<br>ජලයේ හොඳින් දිය වේ | ලා අළු පැහැතිය<br>ගෝලාකාර කැට වේ<br>ජලයේ මඳක් දිය වේ | රතු දුඹුරු පැහැතිය<br>කුඩා ස්ඵටික වේ<br>ජලයේ හොඳින් දිය වේ. |

♦ A, B, C යනු සෘජු පොහොර වර්ග තුනක භෞතික ලක්ෂණ කීහිපයකි. මෙම ලක්ෂණ අනුව A, B, C පොහොර වර්ග තුන පිලිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

1 - යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට්, මියුරේට් ඔෆ් පොටෑෂ්
2 - යූරියා, මියුරියේට් ඔෆ් පොටෑෂ්, ත්‍රිත්ව සුපර් පොස්පේට්
3 - මියුරියේට් ඔෆ් පොටෑෂ්, යූරියා ත්‍රිත්ව සුපර් පොස්පේට්
4 - ත්‍රිත්ව සුපර් පොස්පේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ්, යූරියා

23. කෘෂිකර්මයේදී ඇල්බට් ද්‍රාවණය භාවිතා කරනුයේ,
1 - කෘමි පාලනයට 2 - පත්‍ර කැබලි මුල් ඇද්දවීමට
3 - පාංශු ආම්ලිකතාව උදාසීන කිරීමට 4 - ශාක පෝෂක මාධ්‍යයක් ලෙස

24. බීජ ප්‍රතිකාර කිරීමේ අරමුණක් **<u>නොවන්නේ</u>** මින් කුමක්ද?
1 - බොල් බීජ ඉවත් කිරීමට 2 - ප්‍රවේනික පාරිශුද්ධතාවය සෙවීම
3 - කෘමි හානි වැලැක්වීම 4 - වැපිරීම පහසු කිරීම

25. ජම්බු ශාකයක ඉහළින් ඇති අත්තක් මුල් අද්දවා ගැනීමට යොදා ගත හැකි අතු බැඳීමේ ක්‍රමයකි,
1- සරල අතු බැඳීම 2- සංයුක්ත අතු බැඳීම 3- වායව අතු බැඳිම 4- ගොඩැලි අතු බැඳීම

26. ආහාර නරක්වීම කෙරෙහි බලපාන භෞතික සාධකයක් වන්නේ,
1- එන්සයිම ක්‍රියාකාරීත්වය 2- තෙතමනය
3- ඔක්සිකරණය 4- ආහාර පරිරක්ෂක ද්‍රව්‍ය යෙදීම

27. ශ්‍රී ලංකාවේ දෙමුහුන් අභිජනනයෙන් නිපදවා ඇති වී ප්‍රභේද නම් කිරීමේදී වී ප්‍රභේදයේ වයසද සැලකිල්ලට ගෙන ඇති Bw 351 වී ප්‍රභේදයේ වයස මාස,
    1- 3    2- 3 1/2    3- 4    4- 4 1/2

28. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේදී යොදාගන්නා ස්ථිර ආරක්ෂිත වගා ව්‍යුහයකි
    1- පාත්ති ආවරණ    2- පේලි ආවරණ    3- සරල සූර්ය ප්‍රචාරක    4- දැල් ගෘහ

29. කුඤ්ඤ බද්ධයක් සිදු කිරීමෙන් පසු අනුජය පොලිතින් කවරයකින් ආවරණය කරන්නේ,
    1- කෘමි හානි පාලනය සඳහා    2 - රෝග පාලනය සඳහා
    3- උත්ස්වේදනය පාලනය සඳහා    4 - සුළඟින් වන හානි වැලැක්වීම සඳහා

30. කෘමි පළිබෝධ පාලනයේදී වැදගත් වන ස්වභාවික සතුරන් පමනක් අන්තර්ගත වරණය කුමක්ද?
    1- බත්කූරා, දිමියා,පිටි මකුණා    2 - පැලමැක්කා, වන්දා, මකුළුවා
    3- දිමියා, මකුළුවා, වන්දා    4 - ලේඩිබර්ඩ්, සුදුමැස්සා, කුඩිත්තා

31. වී බෝගය වගා බිමේ සංස්ථාපනය කිරීමේ ක්‍රමවේදයක් නොවන්නේ,
    1- බීජ අහඹු ලෙස විසුරුවා හැරීම    2- බීජ පැළ සිටුවීම හා විසුරුවා හැරිම
    3- බීජ වප්කරයෙන් පේලියට සිටුවීම    4- අතින් බීජ පේලිවලට දැමීම

32. වගා බිමේ වල් පැළෑටි මතුවීමට පෙර ඒවායේ බීජ විනාශ කිරීමට යොදන වල්නාශක කාණ්ඩය හඳුන්වන්නේ,
    1- පූර්ව නිර්ගමන වල්නාශක ලෙසය    2 - පශ්චාත් නිර්ගමන වල්නාශක ලෙසය
    3- සියල්ල නසන වල්නාශක ලෙසය    4 - ස්පර්ශ වල්නාශක ලෙසය

33. මිරිස්, බටු, තක්කාලි වැනි බෝගවලට වැළදෙන බැක්ටීරියා රෝගයකි,
    1- දිය මලං කෑම    2- පිටිපුස් රෝගය    3- හිටුමැරීම    4- ඇන්ත්‍රැක්නෝස් රෝගය

34. අර්ධ රූපාන්තරණයක් ඇති සතෙකි,
    1- ගොයම් මකුණා    2- එපිලැක්නා    3- පළතුරු මැස්සා    4- ඉල්මැස්සා

35. තවාන් පාත්තියක කැප්ටාන් කුඩු මිශ්‍ර කිරීමේ අරමුණකි,
    1- කෘමි හානි පාලනය    2- දිලීර රෝග මර්ධනය    3- වල් පැළ පාලනය    4- ක්ෂුද්‍ර පෝෂක ලබාදිම

36. ලෝහමය ඇසුරුම් ද්‍රව්‍ය සඳහා භාවිත වන මූල ද්‍රව්‍යකි,
    1- ටින්    2 - තඹ    3- ඇලුමිනියම්    4 - අයන්

37. ශාකවලට පහසුවෙන් හා ඉතා ක්‍රමවත් (සූක්ෂම) ලෙස ජලය සපයන ක්‍රමයකි.
    1- බිංදු ජල සම්පාදනය    2- විසිරි ජල සම්පාදනය
    3- බේසම් ජල සම්පාදනය    4- ඇළි ජල සම්පාදනය

38. ශ්‍රී ලංකාව තුල පසු අස්වනු හානිය ප්‍රබලව දැකිය හැක්කේ,
    1- අස්වනු නෙලීමේදී    2- අස්වනු ඇසිරීමේදී    3- අස්වනු ප්‍රවාහනයේදී    4- අස්වනු අලෙවියේදී

39. කඩින් කඩ බෝග වගාවේදී,
    1- බෝග වර්ග කීපයක් එකවිට වගා කරයි.
    2- අස්වනු නෙලීමට පෙර තවත් බෝගයක් ස්ථාපනය කරයි.
    3- ප්‍රධාන බෝගයට අමතරව තවත් බෝගයක් වගා කරයි.
    4- කන්නයෙන් කන්නයට මාරු කරමින් බෝග වගා කරයි.

40. පහත සඳහන් බෝග අතරින් ශ්‍රී ලංකාවේ වැඩිම බිම් ප්‍රමාණයක් වගා කර ඇති බෝග වර්ගය වනුයේ,
    1- තේ ය.    2- රබර් ය.    3- පොල් ය.    4- වී ය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Right Reserved

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023
02 தவணைப்பரீட்சை - 02rd Term Test

| | | |
|---|---|---|
| ශ්‍රේණිය தரம் 11 Grade | කෘෂි හා ආහාර තාක්ෂණය - II<br>Agri & Food Technology<br>விவசாய மற்றும் உணவுதாழினுட்பவியல் | කාලය පැය 02<br>இரண்டு மணித்தியாலம்<br>Two Hours |

♦ **පළමුවෙනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. දේශීය බෝග වගාවට අතහිත දීමක් ලෙස ත් සෞඛ්‍ය ආරක්ෂිත ආහාර බෝග ප්‍රචලිත කිරිමක් ලෙසත් අපේ ආහාර ජනප්‍රිය කිරීම සඳහා කෘෂි ක්ෂේත්‍රය ප්‍රමුඛ වි ඇත.

(i) බෝග වගාව සඳහා සුදුසු පසක තිබිය යුතු භෞතික ගුණාංග දෙකක් නම් කරන්න.

(ii) බෝග වගාවේදි භාවිතා කල හැකි කාබනික පොහොර වර්ග දෙකක් නම් කරන්න.

(iii) බෝග වගාවකින් ප්‍රශස්ත අස්වැන්නක් ලබාගැනීමට බලපාන කාලගුණික පරාමිතීන් දෙකක් නම් කරන්න.

(iv) ඔබ ගෙවත්තේ පැපොල් සහ බතල වගාවක් ආරම්භ කිරිමට අදහස් කරයි නම්,ඒ සඳහා සුදුසු පාත්ති වර්ගය බෝගය අනුව සඳහන් කරන්න.

(v) මිරිස්, බටු, තක්කාලි වැනි බෝග සිටුවීමට තවාන් සකස් කිරීමේදී තවාන් මාධ්‍ය සඳහා යොදාගන්නා ද්‍රව්‍ය හා අනුපාතය සඳහන් කරන්න.

(vi) ගෙවතු වගාවට යොදාගත හැකි පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම දෙකක් නම් කරන්න.

(vii) ඔබ ගෙවත්තේ ලෙමන් හා දෙහි ශාක ඇත්නම් එහි පැළ ප්‍රචාරණය සඳහා යොදාගත හැකි ලේයර් ක්‍රමයක රූප සටහනක් ඇඳ නම් කරන්න.

(viii) උඩරට ගෙවතු වගාවේදී මිශ්‍ර බෝග වගා ක්‍රමයට බෝග වගාව සිදු කරනු ලැබේ. මෙහි ඇති වාසි දෙකක් සඳහන් කරන්න.

(ix) පරිසර හිතකාමී පළිබෝධ පාලනය කිරීම සඳහා උපයෝගී වන පලිබෝධකයින්ගේ ස්වභාවික සතුරන් දෙදෙනෙකු උදාහරණ සහිතව නම් කරන්න.

(x) ප්‍රවාහණයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කර ගැනීමට ඔබ යොදාගන්නා උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

2. බීජ වලින් හැර ශාකයේ අනෙකුත් කොටස්වලින් නව ශාක බිහිකර ගැනීම වර්ධක ප්‍රචාරණයයි. මේ සඳහා මව් ශාකයේ විවිධ වර්ධක කොටස් භාවිතා කරයි.

(i) a- මුල් කැබලි හා පත්‍ර කැබලි මගින් ප්‍රචාරණය කරගත හැකි බෝග වර්ග දෙක බැගින් වෙන වෙනම සඳහන් කරන්න.

b- දඬු කැබලි මුල් ඇදීම උත්තේජනය කිරීමට යොදාගන්නා ක්‍රම දෙකක් නම් කරන්න.

(ii) a- බද්ධ කිරීම සඳහා යොදාගන්නා ග්‍රාහකයක තිබිය යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න.

b- අඹ පැළයකට ආරුක්කු බද්ධයක් සිදුකරන ආකාරය නම් කරන ලද රූප සටහනකින් පැහැදිලි කරන්න.

(iii) වර්ධක ප්‍රචාරණයේ වාසි 04 ක් සඳහන් කරන්න.

03. බෝග වගාවේ දී පෝෂක ඌණතා මගහරවා ගැනීම සඳහා පොහොර යොදනු ලැබේ.

(i) a- බෝගවල පැවැත්ම සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය හතරක් සඳහන් කරන්න.

b- පොටෑසියම් හිඟවීම නිසා ශාකවල දක්නට ලැබෙන ඌණතා ලක්ෂණ දෙකක් නම් කරන්න.

(ii) a- බෝගවලට පොහොර යෙදිය හැකි ක්‍රම හතරක් සඳහන් කරන්න.

b- බෝගවලට රසායනික පොහොර යෙදීමෙන් සිදුවිය හැකි අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

(iii)a- කොළ පොහොර ලෙස යොදාගත හැකි ශාක වර්ග දෙකක් නම් කරන්න.

b- තම ගොවිපළේදීම නිපදවාගත හැකි කාබනික දියර පොහොර වලට උදාහරණ දෙකක් සඳහන් කරන්න.

04. ක්‍රමවත් ලෙස බිම් සැකසීම හා ජල පාලනය බෝග වගාවේ දී උසස් අස්වැන්නක් ලබා ගැනීමට ඉවහල් වන ක්‍රමෝපායකි.

(i) a- බිම් සැකසීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න.

b- මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර දෙක නම් කරන්න.

(ii) a- ජපන් රොටරි වීඩරය කුමන කාර්යයන් සඳහා භාවිතා කරන්නේ ද ?

b- ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවියෙකුට බඩ ඉරිඟු, සෝයා බෝංචි, මුං ඇට වැනි බීජ වැපිරීමට වඩාත් සුදුසු උපකරණයක් නම් කරන්න.

(iii)a- වී වගාව සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රමය සඳහන් කර එහි වාසි දෙකක් දක්වන්න.

b- පසක ජල වහනය දියුණු කිරීමට යොදාගත හැකි කාණු රටා දෙකක් සඳහන් කරන්න.

05. සාර්ථක බෝග අස්වැන්නක් ලබා ගැනීම සඳහා පළිබෝධ හානි අවම කිරීම ඉතා වැදගත් වේ. බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා සියලුම ක්‍රියාකාරකම් පිළිබෝධ හානි අවම කිරීම සඳහා අවධානය යොමු කල යුතුය.

(i) a- වැඩෙන ස්ථානය අනුව වල්පැළෑටි වර්ගීකරණය දක්වා ඒ සඳහා උදාහරණ එක බැගින් ලියන්න.

b- බෝග වගාවේ දි වල්පැළෑටි පාලනය කිරීම සඳහා යොදාගත හැකි රසායනික නොවන ක්‍රම හතරක් ලියන්න.

(ii) a- කෘමි පළිබෝධකයින් බෝග වලට හානි කරන ආකාර දෙකක් සඳහන් කොට ඒ සඳහා උදාහරණ එක බැගින් ලියන්න.

b- පරිසර හිතකාමී කෘමි පළිබෝධ පාලන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(iii) පළතුරු සහ එළවළු බෝගවලට වැළදෙන ඇන්ත්‍රැක්නෝස් රෝගයේ ලක්ෂණ දෙකක් හා එම රෝගය පාලනය සඳහා යොදා ගත හැකි ක්‍රම දෙකක් ලියන්න.

06. සංවර්ධිත රටවල පසු අස්වනු හානිය 10% පමණ වේ. ශ්‍රී ලංකාවේ ඇතුළු සංවර්ධනය වන රටවල එය 20% - 40% අතර අගයක් ගනී. නිෂ්පාදනවල මිල කෙරෙහි මේ තත්වය සෘජුවම බලපානු ඇත.

(i) a- පසු අස්වනු හානිය කෙරෙහි පෙර අස්වනු සාධක බලපානු ලබයි. එවැනි පෙර අස්වනු හානි 02 ක් නම්කරන්න.

b- පසු අස්වනු හානිය වැලැක්වීම, ගොවියාට වැදගත්වන ආකාර දෙකක් සඳහන් කරන්න.

(ii) a- අස්වනු ගබඩා කිරීමේ දී නිසි අයුරින් සිදු නොකිරීම නිසා සිදුවන හානි අවස්ථා 02 ක් ලියන්න.

b- අලෙවියේ දී අස්වැන්නට ගුණාත්මක වශයෙන් හානි අවස්ථා 02 ක් සඳහන් කරන්න.

(iii)a- පසු අස්වනු හානියේ අලාභය පාරිභෝගිකයා වෙත පැවරෙන්නේ කෙසේදැයි සැකෙවින් පැහැදිලි කරන්න.

07. (i) a- නිවර්තන කලාපීය රටවල බෝග වගාකිරීම සඳහා පොලිතීන් ගෘහ යොදාගැනීමේ ප්‍රධාන අරමුණු දෙකක් ලියන්න.

b- පහතරට කලාපයේ පොලිතීන් ගෘහ තුළ උෂ්ණත්වය ඉහළයාම වළක්වා ගැනීමට යොදාගන්නා උපක්‍රම දෙකක් ලියන්න.

(ii) බෝග වගාව සඳහා පොලිතීන් ගෘහ භාවිතයේ වාසි දෙකක් සහ අවාසි දෙකක් ලියන්න.

(iii)a- දැල් ගෘහයක් තුළ පාලනය කළ හැකි පරිසර තත්ත්වයන් දෙකක් ලියන්න.

b- ලී පටි ගෘහයක් තුළ වගා කළ හැකි බෝග වර්ග දෙකක් ලියන්න.

**දෙවන වාර පරීක්ෂණය**
**11 ශ්‍රේණිය - කෘෂි හා ආහාර තාක්ෂණය**
**පිළිතුරු - I පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (11) | 4 | (21) | 4 | (31) | 4 |
| (2) | 1 | (12) | 4 | (22) | 1 | (32) | 1 |
| (3) | 2 | (13) | 2 | (23) | 4 | (33) | 3 |
| (2) | 3 | (14) | 3 | (24) | 2 | (34) | 1 |
| (3) | 2 | (15) | 1 | (25) | 3 | (35) | 2 |
| (6) | 3 | (16) | 3 | (26) | 2 | (36) | 1 |
| (7) | 3 | (17) | 2 | (27) | 2 | (37) | 1 |
| (8) | 2 | (18) | 1 | (28) | 4 | (38) | 3 |
| (9) | 3 | (19) | 2 | (29) | 3 | (39) | 2 |
| (10) | 4 | (20) | 3 | (30) | 3 | (40) | 4 |

**පිළිතුරු - II පත්‍රය**

1. කැටිති ව්‍යුහය, ලෝම පසක්, කළු වර්ණය, කාබනික ද්‍රව්‍ය අඩංගු වීම ජල අවශෝෂණය හා ජල වහනය
2. සත්ත්ව පොහාර, කොම්පෝස්ට් , කොල පොහොර
3. වර්ෂාපතනය, ආලෝකය, උෂ්ණත්වය, සුලඟ
4. පැපොල්- තනිවගා වලවල්, බතල- වැටි හා කාණු
5. මතුපිටපස්: කොම්පෝස්ට් 1:1
6. තීරු, ඇලි වැටි, බේසම්, වලලු
7. ලෙමන් දෙහි
8. වැඩි අස්වැන්න, වසර පුරා අස්වැන්න, විශේෂ බිම් සැකසීම අවශ්‍ය නොවීම, පාංශු ඛාදනය අඩුය.
9. වී වගාව- බත් කූරා, පොල් වගාවේ කොරපොතු කෘමියා- ලේඩි බර්ඩ්, එළවළු වගාව පනුවන් - මකුළුවන්, කුරුල්ලන්
10. කූඩ භාවිතය , ලී පෙට්ටි භාවිතය

02. I. a - මුල් කරපිංචා, දෙල්, පත්‍ර - බිගෝනියා, සැන්සවේරියා

b - සූර්යප්‍රචාරකය, හෝමෝන භාවිතය

II. a - ශක්තිමත් මූල මණ්ඩලය, අහිතකර පරිසර තත්ත්ව ඔරොත්තු දීම, නිරෝගී වීම

b -

III. a -මව් ශාකයට සමාන පැල, ඒකාකාරී වගාවක්, බීජ ප්‍රචාරණයට අපහසු පැළ සඳහා යොදාගත හැකිවීම.

03. I. a - Zn, Cu,Mn,Mo,B,Fe,Cl

b - පත්‍ර දුර කහපාට වීම හා පිළිස්සුනු ස්වභාවය, ශාකය වර්ධනය බාල වීම

II. a - ඉසීම, පැළ අවට යෙදීම, ජලයේ දියකර යෙදිම, පේලිවලට යෙදීම

b - පස ආම්ලික වීම, වැඩි වීමෙන් ශාක මිය යාම

III. a - ග්ලිසිනියා, කැප්පෙටියා වල් සූරියකාන්ත, එරබදු

b - ගොම හා කොල සේසරණය, ගැඩවිල් දියර පොහොර, මත්ස්‍ය තෙලෝදය

04. I. a - පසෙහි භෞතික තත්වය දියුණු වීම, ගල්මුල් ඉවත් කිරීම, පොහොර මිශ්‍ර වීම

පලිබෝධ පාලනය

b - ප්‍රාථමික, ද්විතීයික බිම් සැකසීම

II. a - අතුරුයන් කෘම, වී වගාවේ වල් මර්දනය

b - ගොඩබීජ වර්කරය

III. a - පිටාර ක්‍රමය, වියදම අඩුයි, විශේෂ දැනුමක් අවශ්‍ය නැත, මල් පැළ පාලනය වේ, පසේ ලවණ ඉවත් වේ.

b - හෙරින්බෝන් ක්‍රමය සමාන්තර ක්‍රමය

05. I. a - ගොඩබිම වැඩෙන - මොණර කුඩුම්බිය, ජලයේ වැඩෙන - දියහබරල, දිය සියඹල

b - ආවරණ බෝග සිටුවීම, උදලු ගෑම, අතින් ගැලවීම, නිසි පරතරය, ව්‍යුත් කිරීම, ජලයෙන් යට කිරීම.

II. a - පත්‍ර යුෂ උරා බීම - දුඹුරු පැළ කිඩෑවා, එල සිදුරු කිරීම - ඉල් මැස්සා, පත්‍ර කා දැමීම- අවුලකගෝරා

b - ප්‍රතිරෝධී ප්‍රභේද වගාව, විකර්ෂණ බෝග, පෙරමෝන උගුල, අල්ලා විනාශ කිරීම, කොහොඹ ඇට නිස්සාරය

III. පත්‍ර කහ දුඹුරු කළු පැහැ ගැනීම, එල වත තෙත් රවුම් පුල්ලි, එල කුණු වීම. පත්‍ර හැලීයාම.

06. I. a - ප්‍රදේශයට ගැලපෙන බෝග තෝරා ගැනීම, ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය භාවිතය, අක්‍රමවත් ජල සම්පාදනය, පොහොර නිසි ලෙස නොයෙදීම,පළිබෝධ පාලනය නොකිරීම.

b - ඉහළ මිලක්, අවදානම අඩුවීම, ස්ථාවර වෙළඳ පොළක්, ඉහළ ඉල්ලුම

II. a - පළිබෝධහානි, යාන්ත්‍රික හානි, උෂ්ණත්ව හානි, ආර්ද්‍රතා හානි.

b - අව්වට වියළීම, තැළීම, පැහැය වෙනස්වීම, අපද්‍රව්‍ය එකතුවීම.

III. අළුවියේදී අස්වනු මිල අඩුවම. අස්වනු හානි විම. එහිදී වෙළෙන්දා පාඩු නොලබයි. එම නිසා අස්වනුවලට ගොවියාට අඩුවෙන් ගෙවයි.

07. I. a - පළිබොධ හානි අවම කරගැනීම, ගුණාත්මක අස්වනු ලබාගැනීම, පොෂණ ඌණතා අඩුකිරීම.

b - මට්ටම් දෙකකට සැකසීම, වහලයේ කවුළු තිබීම, පංකා භාවිතය. මීනුම් ආකාරයට ජලය ඉසීම, පැති බිත්ති ප්‍රතිරෝධී දැල්වලින් ආවරණය.

II. a - වාසි - ගුණාත්මක අස්වැන්න, කෘමිහානි නොතිබීම, වල්පැළ පාලනය,

අවාසි - අධික වියදම, තාක්ෂණ දැනුම අවශ්‍ය වීම, පොලිතින් ඉරීයාම සුලගට, උෂ්ණත්වය ඉහළයාම

III. a - සුලංහානි, කෘමි හානි, ආලෝකය.

b - විසිතුරු ශාක, ඇන්තූරියම්, ඕකිඩ්, පර්බෙරා


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න